සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

9 ශ්‍රේණිය | පළමු වාර පරීක්ෂණය - 2019 | 40 S

නම ...............................................

පෙරදිග සංගීතය

කාලය පැය දෙකයි

●සැළකිය යුතුයි:-

● සියළුම ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර සපයන්න.

01. ස්වර වලින් පමණක් සමන්විත ගීත විශේෂයකි.
1. මධ්‍යාලය ගී 2. ලක්ෂණ ගී 3. සර්ගම් ගී 4. භජන් ගී

02. රාගයකට අදාල නොවූව ද රාග රසය වැඩිකර ගැනීම සඳහා යොදා ගනු ලබන ස්වර හඳුන්වනු ලබන්නේ,
1. වාදී ස්වර 2. වර්ජ්‍ය ස්වර 3. සංවාදී ස්වර 4. විවාදී ස්වර

03. ' වාසනා දිනේකි මේක පාමු තුටින්' යන නූර්ති ගීතය අයත් නූර්තිය වන්නේ,
1. දුටුගැමුණු 2. ශ්‍රී වික්‍රම 3. වෙස්සන්තර 4. රාජසිංහ

04. ගරි, ගපධනිසං ................. යන ස්වර සංගතිය යෙදෙන රාගය වනුයේ,
1.බිලාවල් 2. කාෆි 3. යමන් 4. භූපාලි

05. මිහිකත / නලවාs /ලාs s s /s s s s/
ඉහත ගීත ප්‍රස්තාරය සඳහා ගැලපෙන තාලය වන්නේ
1. ජප් තාලය 2. කෙහෙර්වා 3. දීප්චන්දි 4. බෙම්ටො

06. C major Chord එකට අයත් ස්වර මොනවාද ?
1. සගප 2. පනි රිං 3. මධසං 4. සගුප

07. හින්දුස්ථානී සංගීතයේ ථාට ගණන කියද?
1. 04 කි 2. 08 කි 03. 10 කි 4. 12 කි

08. සරිගරි සරිස-, රිගමග රිගරි ---------- මෙම ස්වර අභ්‍යාසයේ හිස්තැනට සුදුසු ස්වර කණ්ඩය තෝරන්න.
1. ගපමග පමග- 2. ගපමප ගමග-
3. ගමපම ගමග- 4. ගරිමග පමග-

09. දෑතේ ඇඟිලි යොදා ගනිමින් ගීතය සමඟ Chords වාදනය කල හැකි සුසිර වාද්‍ය භාණ්ඩය කුමක්ද?
1. විදුලි ඕගනය 2. මෙලෝඩිකාව 3. එකෝඩියනය 4. සර්පිනාව

10. නාඩගම් සම්ප්‍රදාය සඳහා යොදා ගන්නා අවනද්ධ භාණ්ඩය වන්නේ,
1. තබ්ලාවයි 2. මද්දලයයි 3. ගැටබෙරයයි. 4. දවුලයි

11. සාමාන්‍ය බොක්ස් ගිටාර් එකක තත් ගණන වනුයේ
1. 05 කි 2. 06 කි 3. 04 කි 4. 08 කි

12. රාගයක විස්තර ඇතුළත් වන්නේ,
1. සර්ගම් ගීතයක ය 2. මධ්‍යාලය ගීතයක ය 3. භජන් ගීතයක ය 4. ලක්ෂණ ගීතයක ය

13. සිතාරය වාදනය සඳහා ඇඟිල්ලේ පලඳින උපකරණය කුමක් ද?
1. මිස්රාබ් 2. පික් එක 3. බෝ එක 4. අළුව

14. බටහිර සංගීතයේ 7/8 යන Time Signature ට ගැළපෙන හින්දුස්ථානී තාලය වන්නේ,
1. බෙම්ටො 2. ජප් 3. දීප්චන්දි 4. දාදරා

15. එකෝඩියනය කුමක භාණ්ඩ ඝණයට අයත් ද?
1. සුෂිර 2. විද්‍යුත් 3. ඝණ 4. තත්

16. වාදී සංවාදී හැරුණු විට රාගයේ යෙදෙන ඉතිරි ස්වර හඳුන්වන්නේ කුමන නමින්ද?
1. වර්ජ්‍ය ස්වර 2. අනුවාදී ස්වර 3. කන් ස්වර 4. විකෘති ස්වර

17. කණ්ඩායම් ගීතයක් සඳහා උදාහරණයකි.
1. මංගෝ කළු නැන්දේ 2. දෑතට වළලු
3. ලෝනා මුනි රාජගේ 4. දැක්කොත් පද්මාවතී

18. රාගයක මූලික රාග ජාති
1. 1 කි 2. 3 කි 3. 5 කි 4. 4 කි

19. තාලයක ප්‍රබලම ස්ථානය හඳුන්වන්නේ
1. අනුතාල 2. ඛලිය 3. සමස්ථානය 4. ආවර්ථ

20. චල ස්වර වලට අයත් වන්නේ
1. කෝමල හා තීව්‍ර ස්වර යි 2. වාදි හා සංවාදී ස්වර යි
3. ශුද්ධ හා කෝමල ස්වර යි 4. තීව්‍ර හා උච්ච ස්වර යි

## II කොටස

- **ප්‍රශ්න 03 කට පමණක් පිළිතුරු සපයන්න.**

(01) i. බිලාවල් රාගයේ මධ්‍යාලය ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ල. 04)
ii. මෙම රාගයට අදාලව ස්වර අභ්‍යාසයක් උච්ච සඩ්ජය දක්වා ලියන්න. (ල. 02)
iii. එම රාගයට අදාල ජාතිය, වාදී , සංවාදී මුඛ්‍යාංගය ලියන්න. (ල.04)

(02) i. මාත්‍රා 16 කින් යුත් හින්දුස්ථානී තාලය නම් කරන්න. (ල. 02)
ii. එම තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ල. 04)
iii. ඔබ කැමති ගී පද පෙලක් ඉහත තාලයට අනුව ප්‍රස්තාර කරන්න. (ල. 04)

(03) i. වාදී, සංවාදී, අනුවාදී, විවාදී , වර්ජ්‍ය යන ස්වර වර්ග වලින් 4 ක් පිළිබඳව කෙටි සටහන් ලියන්න. (ල. 08)
ii. හින්දුස්ථානී සංගීතයේ මේල දෙකක් නම් කරන්න. (ල. 02)

(04) i. ගිටාරයේ රූප සටහනක් ඇඳ ප්‍රධාන කොටස් 04 ක් නම් කරන්න. (ල. 04)
ii. ගිටාරයේ තත් 06 සුසර කරනු ලබන්නේ කුමන ස්වර වලටදැයි පිළිවෙලින් ලියන්න. (ල. 03)
iii. ඔබ කැමති Major Chord එකක් නම් කර ගිටාරයේ Fret board මත (ඇඟිලි පුවරුව මත) ඊට අදාළ ස්වර සඳහන් කරමින් ලකුණු කරන්න. (ල.03)

(05) i. කණ්ඩායම් සංගීතයේ දක්නට ලැබෙන විශේෂ ලක්‍ෂණ 05 ක් නම් කරන්න. (ල. 05)
ii. ඒ සඳහා පුරෝගාමී වූ ගායන කණ්ඩායම් දෙකක් නම් කරන්න. (ල. 02)
iii. ඒ සඳහා විශේෂ වූ සංගීත භාණ්ඩ 03 ක් නම් කරන්න. (ල. 03)

# පළමු වාර පරීක්ෂණය - 2019
## 9 ශ්‍රේණිය පෙරදිග සංගීතය
## පිළිතුරු පත්‍රය
### I කොටස

| | |
|---|---|
| 1 - 3 | 11 - 2 |
| 2 - 4 | 12 - 4 |
| 3 - 2 | 13 - 1 |
| 4 - 1 | 14 - 3 |
| 5 - 2 | 15 - 1 |
| 6 - 1 | 16 - 2 |
| 7 - 3 | 17 - 1 |
| 8 - 3 | 18 - 2 |
| 9 - 3 | 19 - 3 |
| 10- 2 | 20 - 1 |

### II කොටස

(01) i. අදාල රාගයේ මධ්‍යලය ගීතය ගීත ස්වර ප්‍රස්තාර කිරීමට (ල. 04)

ii. ස්වර අභ්‍යාසය උච්ච සඩ්ජය දක්වා ලිවීමට (ල. 02)

iii. රාගයට අදාල ජාතිය, වාදී, සංවාදී මුඛ්‍යාංගය ලිවීමට (ල. 04)
මුළු ලකුණු 10

02) i. ත්‍රිතාලය (ල. 02)
ii. තාලය නිවැරදි තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීමට (ල. 04)

iii. තාලයට අදාලව ගී පදයක් ප්‍රස්තාර කිරීමට (ල. 04)
මුළු ලකුණු 10

((03) i. අදාල මාතෘකා සඳහා කෙටි සටහන් ලිවීමට (4x2) (ල. 08)

ii. මේල දෙකක් නම් කිරීමට (ල. 02)
මුළු ලකුණු 10

(04) i. ගිටාරයක දළ රූප සටහනක් ඇඳ කොටස් 04 නම් කිරීමට
(දළ රූප සටහන පමණක් ඇති විට ලකුණු 01 කි) (ල. 04)

ii. පහත ආකාරයට තත් සුසර කිරීමට
ග නි ප රි ධ ග / ග ධ රි ප නි ග (ල. 03)
1 2 3 4 5 6 / 6 5 4 3 2 1

iii. ගිටාරයේ ඇඟිලි පුවරුව මත Major Chords එකක්
ලකුණු කිරීමට (ල. 03)
මුළු ලකුණු 10

(05) i. කණ්ඩායම් සංගීතයේ විශේෂ ලක්ෂණ 05 ක් සඳහා (ල. 05)

ii. මී මැස්සෝ / ජිප්සීස් / ත්‍රී සිස්ටර්ස් / ලොස් කැබෙලරොස් /
සමනළයෝ වැනි කණ්ඩායම් දෙකක් නම් කිරීමට (ල. 02)

iii. ඒ සඳහා විශේෂ වූ සංගීත භාණ්ඩ 03 ක් නම්කිරීමට (ල. 03)
මුළු ලකුණු 10